Journal of Intangible Cultural Heritage

JICH (2024), Volume 3 (II)

# A Case Study of the Past, Present and Future of the Sesath Industry of Unaveruwa

## උණවේරුවේ සේසත් කර්මාන්තයේ අතීතය, වර්තමානය සහ අනාගතය පිළිබඳ සිද්ධි අධ්‍යයනයක්

K. D. G. Shanika Kumarasinghe* and U. D. R. Shehan Thilakarathna

Department of Archaeology, University of Peradeniya, Sri Lanka
*shanikakumarasinghe1996@gmail.com

## *Abstract*

*Handicrafts represent a unique aspect of art in Asian cultures. They are a living cultural heritage that still continues in today's society. Handicrafts that use natural raw materials and simple techniques are excellent in quality and decoration as an end product. Sesath is one such traditional product in our country. At present, the traditional practice of Sesath making this is limited to only one region in Sri Lanka. Research problem is "What are the challenges to the continuity of Sesath industry in Unaveruwa?" Therefore, the aim of this study is to study the current nature of the traditional Sesath industry and the challenges faced by the industry in its continuity. The study area is Unaveruwa village in the Matale district. Interviews were conducted with 20 artisans and obtained information through field observations. Among the results of the study, Sesath has become a consumer product of the upper class of society in Sri Lanka. It was confirmed that the traditional Sesath industry in Unaveruwa is dying out. In the past, the youth have also shown interest in learning about the industry. There was no gender difference in Sesath making and the youth assisted the older artisans. In this way, the traditional knowledge of Sesath making passed to the next generation. But at present, the youth no longer assist the older artisans. The continuity of this traditional craft industry is seriously threatened due to the inability to purchase graphite, the main raw material, the lack of interest of the youth to join and continue this craft industry and not having a market for the products. Unaveruwa is located between two world heritage cities of Anuradhapura and Kandy. Sigiriya, a well-known World Heritage site, is located in Matale district. However, there are no initiatives in Unaveruwa to attract these tourists and sell their products to the tourists and local visitors. It would be beneficial to implement such programmes with government support to protect this traditional craft technology. Furthermore, it is suggested to encourage undergraduates who are studying archeology and fine arts to learn about such a dying tradition in order to preserve as an intangible cultural heritage in Sri Lanka.*

***Key Words:*** *Challenges, Handicrafts, Sesath, Traditionalism, Unaveruwa*

## 1. හැඳින්වීම

ශිෂ්ටාචාර අවධියට ප්‍රවිශ්ට වෙත්ම මානවයා විවිධ හස්ත කලාශිල්පයන්හි ප්‍රාගුණ්‍යතාවයක් අත්පත් කර ගැනීමට සමත් විය. බටහිර මෙන්ම ආසියානු සභ්‍යත්වයන් තුළ කලාවේ සුවිශේෂී පැතිකඩක් නියෝජනය කරන හස්ත කලා ශිල්ප වත්මන් සමාජයේ ද සක්‍රීයව පවතින ජීවමාන සංස්කෘතික උරුමයකි. ස්වාභාවික අමුද්‍රව්‍ය ප්‍රධාන මූලද්‍රව්‍ය ලෙස භාවිත කරමින් සරල තාක්ෂණික ක්‍රමවේද උපයෝගී කරගනිමින් නිර්මාණය කරන හස්ත කලාශිල්පයන්හි අවසන් නිමැවුම ගුණාත්මක බවින් මෙන් ම අලංකරණයෙන් ද විශිෂ්ට වූවකි. ලාංකීය සභ්‍යත්වය තුළ ද එකී විශිෂ්ටත්වය මැනවින් ඉස්මතු කරන පාරම්පරික හස්ත කලාශිල්ප ගණනාවක් පවතියි. ඇත්දත්, මැටි, ලාක්ෂා, යකඩ, පිත්තල හා රන් රිදී, දැව, බෙර, රෙදි විවීම ආදී විවිධ කර්මාන්ත ඊට නිදසුන් වේ. මේ ඇතැම් කර්මාන්ත තවමත් ලාංකේය සමාජයෙහි සක්‍රීයව කරගෙන යන අතර ඇතැම් ඒවා සම්පූර්ණයෙන් ම පාහේ වියැකී ගොසිනි. තවමත් සක්‍රීයව සිදුකරන සාම්ප්‍රදායික කර්මාන්ත පවා දැඩි ලෙස සාම්ප්‍රදායික ක්‍රමවේද භාවිතයෙන් ඉවත්ව නවීන තාක්ෂණය උපයෝගී කරගනිමින් සිදුකරනු හඳුනාගත හැකිය.

වර්තමානයේ දී අපගේ සාම්ප්‍රදායික හස්ත කර්මාන්ත මුහුණ දී ඇති ඛේදනීය තත්ත්වය පිළිබඳව ඊ. රුද්‍රිගු මහත්මිය 1960දී සිදුකර ඇති විස්තරයක් පහත දැක්වේ.

> "1815 ආරම්භ කරන ලද ජාතියට විෂම වූ අධ්‍යාපන ක්‍රමය සහ විශේෂයෙන්ම වර්තාමන පරම්පරාව මේ පිළිබඳව දක්වන මන්දෝත්සහයත් කරණකොටගෙන අපේ පුරාන හස්ත කර්මාන්ත කාරයින්ගේ විශිෂ්ඨ දැනුම අප අතරින් තුරන්ව ගොස් තිබේ. එපමණක් ද නොව ජාතිය සතු නෛසර්ගික කලාකාමිත්වය සුදුසු අවස්ථාවන් සහ නිසි අනුබලයක් නොමැතිවීමෙන් අප ඇස් හමුවේම වඳ වී යන්නේය. දැනේ කර්මාන්ත වලට උපන් හපන්නු වන අප හැඩිදැඩි කම්කරුවන් බවට පරිවර්තනය වී ගෙන යන බව පැහැදිලිව පෙනෙන දෙයකි" (රුද්‍රිගු, 1960: 43)

සාම්ප්‍රදායික හස්ත කර්මාන්ත මුහුණ දී ඇති ඛේදනීය තත්ත්වය පිළිබඳව උක්ත විස්තරයෙන් පැහැදිලි අවබෝධයක් ලබා ගත හැකිය. මෙරට සාම්ප්‍රදායික හස්ත කර්මාන්ත අතරට ගැණෙන සේසත් කර්මාන්තයේ ද ඉදිරි පැවැත්මට වර්තමානයේ දී අත්වී ඇත්තේ ද ඉහත විස්තරයෙන් කියැවෙන ආකාරයේ ඉරණමකි. වර්තමානයේ දී ලංකාවේ සාම්ප්‍රදායික සේසත් කර්මාන්තය සිදුකරන්නේ එක් ගමක පමණි. ඒ මාතලේ දිස්ත්‍රික්කයේ උණවේරුව ග්‍රාමයයි.

## 1.1 සේසත් කර්මාන්තය

සේසත් කර්මාන්තය සක්‍රීයව ක්‍රියාත්මක වන හස්ත කලාශිල්පයකි. 'සත්' යනු ඡත්‍රයට පර්යාය පදයකි. මුල් කාලයේ ඡත්‍රය නිර්මාණය වූයේ සුදු පැහැයෙන් පමණක් වීම හේතුවෙන් ශ්වේත ඡත්‍රය, ධවල ඡත්‍රය, සේසත ආදී නම්වලින් හැඳින් වූ අතර මෙය රාජ කකුධ භාණ්ඩ අතුරින් එකක් ලෙස භාවිත විය (ධර්මබන්ද්‍ර, 1962: 1267 හා 1282). ලාංකේය සමාජ සන්දර්භය තුළ සෞභාග්‍ය, සශ්‍රීකත්වය හා ගාම්භීරත්වය ඉස්මතු කරවන මංගල වස්තුවක් ලෙස සලකන සේසත වර්තමානයේ බෞද්ධ ආගමික විහාරස්ථානවල, රාජ්‍ය ආයතන හා ප්‍රභූ නිවාසවල ගෘහ අංලකරණාත්මක නිර්මාණයක් ලෙස බහුලව භාවිත වේ. හඟුරන්කෙත මාළිගාවේ අවුරුදු 185ක් පමණ පරණ සේසත් ජෝඩුවක් තැන්පත් කර තිබේ (තිලකසිරි, 1994: 212).

> "අව් අත්ත සහ මුරායුධය සිංහල සංස්කෘතියේ සංකේතයක් බවට පත්ව තිබීමෙන්ම ජාතික හා සංස්කෘතික වශයෙන් එම භාණ්ඩවල ඇති වැදගත්කම පැහැදිලි වේ. පෙරහැරක ප්‍රභූන් ගමන් ගන්නා ස්ථානයේ අව් අතු සහ මුරායුධ ගෙනයාම පිළිගත් සම්ප්‍රදායකි. අවමංගල පෙරහැරක දී දෙණ දෙපසින් මුරායුධ හා අව් අතු ගෙන යනු ලැබේ. සිංහලයින්ගේ මංගල

අවස්ථාවලදී මෙන්ම අවමංගල අවස්ථාවලදී ද මේවා පාවිච්චි කරන බැව් පෙනේ. මංගල අවස්ථාවලදී අලංකාරය හා ගරු ගාම්භීරත්වය ද, අවමංගල අවස්ථාවලදී මියගියවුන් සඳහා දක්වෙන ගෞරවය ද ඉන් පිළිබිඹු කෙරේ. ඇතැම් නිවෙස්වල විසිත්ත කාමරයේ අලංකාරය සඳහා ද මේවා තබනු ලැබේ. මධ්‍යකාලීන සමාජයේ ප්‍රභූන්ගේ නිවෙස් සැරසූ භාණ්ඩයක් වූ අව් අත්ත හා මුරායුධය වර්තමාන සමාජයෙහි ඒවා මිළදී ගැනීමට හැකි බොහෝ අය කිසිම අරුතක් නොමැතිව තම නිවෙස්වල තබාගන්නා බව පෙනේ. කෙසේ වුවද යස ඉසුරු සහ සෞභාග්‍යය සංකේතවත් කරන සේසත දේශීය කලාවේ උසස් ස්ථානයක් හිමි කොටගෙන ඇති භාණ්ඩයක් වශයෙන් හැඳින්විය හැකිය." (ගුණසේකර සහ ගුණවර්ධන, 1984: 173 සහ 174)

## 1.2 උණවේරුව ග්‍රාමයේ සේසත් කර්මාන්තයේ ඉතිහාසය

සාම්ප්‍රදායික සේසත් කර්මාන්තය සක්‍රීයව ක්‍රියාත්මක වන්නේ මධ්‍යම පළාතේ මාතලේ දිස්ත්‍රික්කයේ යටවත්ත ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයට අයත් උණවේරුව ග්‍රාම නිලධාරි වසමෙහිය. ඔවුන්ගේ ඓතිහාසික පසුබිම හා සමාජීය තත්ත්වය සාහිත්‍ය මූලාශ්‍ර හා අභිලේඛන මූලාශ්‍ර ඇසුරින් විමසීමේ දී ශ්‍රී මහා බෝධි ආගමනයත් සමග පැමිණෙන ශිල්ප ශ්‍රේණි හා සම්බන්ධ වන බවට හඳුනාගත හැකිය. බෝධි සංස්කෘතිය විස්තරාත්මකව හෙළි කරන බෝධිවංශය තුළ සේසත හා සම්බන්ධ ප්‍රධාන පිරිස් ත්‍රිත්වයක් පිළිබඳව සඳහන් වේ.

> "සරස් කුලයෙහි ප්‍රධාන තැනැත්තනට තමා පිරිවර සරසුන් ගෙන සේසත් වඩනු කොට සරස්නා තනතුරු දුන්නේ ය" (සිංහංල බෝධිවංශය, 1970: 285).

> "ඡතක්‍රාර කුලයෙහි ප්‍රධානයා හට තමා පිරිවර සත්කරුවන් ගෙන මහබොයට පුදන සේසත් කරවා දෙනු කොට සත්කරුනා තනතුරු දුන්නේ" (සිංහල බෝධිවංශය, 1970: 287).

ප්‍රධාන ශිල්ප ශ්‍රේණි දහඅටට අමතරව බෝධින් වහන්සේ වැඩම කර වූ පිරිස අතර රාජ පරම්පරාවන් නියෝජනය කළ බෝධිගුප්ත, සුමිත්ත, චන්ද්‍රගුප්ත, දේවගුප්ත, ධර්මගුප්ත, සූර්යගුප්ත, ගෝතම, ජුතින්ධර නම් රාජ කුමාරවරු අටදෙනෙක් පැමිණ ඇත. එම පිරිස අතර සිටි ගෝතම කුමරුහට මහා බෝධීන් වහන්සේගේ මුදුනෙහි ධවලච්ඡත්‍ර දැරීමේ සත්ගන්නා තනතුර දුන් බව සඳහන් වේ (සිංහල බෝධිවශය, 1970: 285).

සරස් නා, සත්කරු නා හා සත්ගන් නා ලෙස ප්‍රධාන පුද්ගලයන් තිදෙනෙකු යටතේ සේසත හා සම්බන්ධ වූ විවිධ කාර්යයන් නියම වු මෙම පිරිස් අතරින් සේසත නිර්මාණකරණය භාර වු පිරිස ඡත්‍රකාර කුලයට අයත් වූ සත්කරුවෝ වූහ. අනෙක් දෙපිරිස සේසත නිර්මාණයෙන් පසු බෝධීන් වහන්සේට සේසත පූජා කිරීමේ වත් පිළිවෙත් නියම වූවෝ වෙති. වර්තමානයේ දී සත්කරුවන් වාසය කරන උණවේරුව ග්‍රාමය වෙත ඔවුන්ගේ සංක්‍රමණය සිදුවීම පිළිබඳව කඩයිම් පොත් විමර්ශනයෙන් හා ලෝරිගේ වාර්තා ඇසුරෙන් අදහසක් ලබා ගත හැකිය.

සේසත් නිර්මාණකරණයේ මූලාරම්භක පුද්ගලයා ශ්‍රමණ වෙල්ලි බ්‍රාහ්මණ කුලයට අයත් දිනමුතු වල්ලියා වූ බව සඳහන් වේ. දිනමුතු වල්ලියා පැවත එන කුල පරම්පරාව වෙල්ලිදුර පරම්පරාව ලෙස හඳුන්වා ඇත. ඔහු පදිංචි වී සිටියේ වර්තමානයේ මෙම සේසත් කර්මාන්තය පැවතෙන උණවේරුව ග්‍රාමයට නුදුරු දීවිල්ල නම් ප්‍රදේශයේ ය. ශ්‍රී මහා බෝධීන් වහන්සේ වැඩම කිරීම සමග පැමිණි ජනයා දිවයිනේ විවිධ ප්‍රදේශවල පදිංචි වූ අතර එම ප්‍රදේශ අතර මාතලේ දිස්ත්‍රික්කයට අදාළ ප්‍රදේශ ගණනාවක් දැක්වේ. එහි එක් ප්‍රදේශයක් ලෙස දීවිල්ල සඳහන් වේ (අභයවර්ධන, 1978: 136).

දීවිල්ලෙහි පදිංචි ජනයා ශුද්ධ වූ බෝධි වෘක්ෂය මෙරටට රැගෙන ආ මුල් පරම්පරාවේ එක් අයෙකු වූ රුවන් වෙල්ලියා දුරයාගෙන් පැවත එන්නන් ය (ලෝරි ගැසට්, 2014: 245). මාතලේ කඩයිම් පොතේ මෙන්ම ලෝරිගේ කෘතියේ දී ද බෝධීන් වහන්සේ වැඩම වූ මුල් පිරිස් අතර සිටි වෙල්ලිදුර පරපුරට අයත් පුද්ලයන් සතර දෙනෙක් පිළිබඳවත්, ඔවුන් පදිංචි වූ ප්‍රදේශ පිළිබඳවත් දක්වේ. ඒ අනුව රුවන් වෙල්ලියා දීවිල්ලේ ද, මිනිවන් වෙල්ලියා ලොලුවල ද , රන්කොත් වල්ලියා සැලගම ද පදිංචි වී ඇත (අභයවර්ධන, 1978: 226 සහ Lawrie, 1898: 881). රන්කොත් වල්ලියා ලෙස සඳහන් පුද්ගලයා මාතලේ කඩයිම් පොතේ සඳහන් වන්නේ රන්කොත් යමනා වශයෙනි. ඔහු මාතලේ පල්ලෙපොළ පදිංචි වී ඇත (අභයවර්ධන, 1978: 226).

දෙතිස් ඵලරුහ බෝධි රෝපණය කිරීමේදී දීවිල්ලට නුදුරු සැලගම රුසිගම එක් බෝධියක් රෝපණය කර තිබේ (සිංහල බෝධිවංශය, 1970: 280) ඒ අනුව රුසිගම රෝපණය කරන ලද්දා වූ බෝධීන් වහන්සේට පුජා සත්කාර කිරීම පිණිස ජය ශ්‍රී මහා බෝධියේ ආරක්ෂාවට පත්කළ කුල පරම්පරාවේ පිරිස් මෙම ප්‍රදේශයවලට යවන්නට ඇති බවට අනුමාන කළ හැකිය. ඒ අනුව ඓතිහාසික මුලාශ්‍රන්ගේ විස්තර වන වෙල්ලිදුර පරම්පරාවේ මූලාරම්භක පුද්ගලයන් හා සේසත් නිර්මාණකරණයේ මූලාරම්භකයා ලෙස විශ්වාස කරන දිනමුතු වල්ලියා එකම කුල පරම්පරාවකට අයත් වූ බවට උපකල්පනය කළ හැකිය. වර්තමානයේ ද මෙම ප්‍රදේශවල පදිංචි ජනයා ගෙන් බොහොමයක් එක සමාන කුල පරම්පරාවකට අයත් වුවෝ වෙති.

දීවිල්ලේ හා ඒ අවට ප්‍රදේශවල පදිංචිව සිට වෙල්ලිදුර කුල පරම්පරාවෙන් පැවත එන්නෝ පසුකාලයේ දී උණුවේරුව ග්‍රාමයේ ද පදිංචි වී ඇත. දකුණු මාතලේ ප්‍රදේශයට අයත් අස්ගිරි උඩසිය පත්තුවේ පමුණුව වසමේ පිහිටි එක් ගමක් ලෙස සඳහන් කර ඇති උණුවේරුව අතීතයේ හඳුන්වා ඇත්තේ "උණගන් වෙහෙර" නමිනි. මෙම ග්‍රාම නාමය නිර්මාණය වීම පිළිබඳව ජනප්‍රවාදයේ විවිධ කතා පවතියි. උණගස් බොහෝ සෙයින් වූ බැවින් උණවේළුව පසුව උණුවේරුව වූ බව විශ්වාශ කරයි. කෝට්ටේ ධර්ම පරාක්‍රමබාහු රජු පැරදී විත් උඩස්ගිරියේ පදිංචි වී සිටි බව මෙන්ම රජුගේ නළලේ තිබූ ඌර්ණ රෝමය සිහිවීම පිණිස 'ඌර්ණගම් වෙහෙර' නමින් වෙහෙරක් කරවූ ප්‍රදේශය මෙනමින් හැඳින් වූ බව තවත් ජනප්‍රවාදයකි (ගුණසේකර සහ ගුණවර්ධන, 1984: 173). තවද උණගස් භාවිත කර සැදූ වෙහෙරක් තිබූ හෙයින් උණ වෙහෙර උණුවේරුව වූ බවට ද තවත් එක් ජනප්‍රවාදයක් වේ.

උදාගම් ව්‍යාපාරය යටතේ උණුවේරුව ගම සේසත්ගම ලෙස නම් කෙරිණි. අද වන විට උණුවේරුව සහ සේසත්ගම යන ග්‍රාම නාමයන් දෙකම මේ ගම හැඳින්වීමට භාවිත වේ. උණුවේරුව ගම උණුවේරුව, හයිවෝල්ටන් නව ජනපදය හා හයිවෝල්ටන් පැරණි ජනපදය ලෙස පසුකාලීනව කොටස් තුනකට බෙදුනි. මේ කොටස් තුනෙහි ම වාසය කරන්නේ උණුවේරුව මුල් ගමෙන් ගොස් පදිංචි වූ පිරිස් බැවින් ඔවුහු 'හයිවෝල්ටන්' යන නම වෙනුවට උණුවේරුව පැරණි ජනපදය හා උණුවේරුව නව ජනපදය යන නම් ස්වකීය නව ජනපද හැඳින්වීමට භාවිත කරති (විජයවර්ධන, 2021 ජනවාරි 6). මුල් කාලයේ දී මෙම ගමේ පදිංචි වී සිටියේ පවුල් 04ක් පමණි. එනම් කිරා දුරයලෑ ගෙදර, පුසුඹා දුරයලෑ ගෙදර, කොමලා දුරයලෑ ගෙදර සහ පංචාවත්තේ ගෙදර යන පවුල් කිහිපයයි (ගුණසේකර සහ ගුණවර්ධන, 1984: 173). වර්තමානයේ සේසත් කලාව පවත්වා ගෙන යන බොහොමයක් පිරිස් ද මෙම මුල් පවුල් සතරට අයත් වේ.

උණුවේරුවේ සේසත් කර්මාන්තය අභාවයට යමින් තිබිය දී එම කර්මාන්තය නඟා සිටුවීමට උණුවේරුවේ ම ශිල්පියෙකු වූ කිරා දුරයලාගේ ගෙදර ලොකු කිරියා විසින් වර්ෂ 1968 දී රාජ්‍යයේ සහයෙන් පුහුණු මධ්‍යස්ථානයක් ආරම්භ කර ඇත (විජයවර්ධන, 2021 ජනවාරි 6). කිරා දුරයලාගේ ගෙදර ලොකු කිරියා ගෙන් සේසත් කර්මාන්තය උගත් පිරිස් අදටත් මේ ගමෙහි සේසත් කර්මාන්තය සිදුකරති. කිරා දුරයලාගේ ගෙදර ලොකු කිරියා සේසත් කර්මාන්තය ඉගෙන ගෙන තිබෙන්නේ ඔහුගේ ලොකු තාත්තා වූ කලුවා ගුරුන්නාන්සේ ගෙනි. කලුවා ගුරුන්නාන්සේ එම ශිල්පය ඉගෙන

ගෙන තිබෙන්නේ ඔහුගේ පියා ගෙනි. ඔහු නමින් කොමලාදූරයලාගේ ගෙදර මුසෙන්ඩියා ය (ස්වර්ණමාලි, 2019: 341). අතීතයේ සිට ම සේසතේ මිට නිර්මාණය කොට ගෙන්වා ගන්නා ලද්දේ ලාක්ෂා ගම්මානයක් වන මාතලේ හපුවිද ගමෙනි. අද ද ලාක්ෂා කරන ලද හෝ ලාක්ෂා රහිත මිටවල් හපුවිද ගමෙන් ගෙන්වා ගනියි. එහෙත් 1970 දී පමණ කිරා දූරයලාගේ ගෙදර ලොකු කිරියා විසින් හපුවිද ගමෙන් හොර රහසේ බලා සිට ලාක්ෂා කලාව ඉගෙන ගෙන විත් උණවේරුවේ ලාක්ෂා කර්මාන්තය ව්‍යාප්ත කොට ඇත. මේ සම්බන්ධයෙන් තවත් අදහසක් ද පවතියි. ඒ පිළිබඳව උණවේරුව දිමුතු ශිල්ප සංවර්ධන සමිතියේ ලේකම් ජී. ජී. නන්දාවතී මහත්මිය මෙසේ පැහැදිලි කරයි.

> "ලාක්ෂා කර්මාන්තය තිබෙන්නේ හපුවිද ගමේ. එතනින් උණවේරුවට මේ කර්මාන්තය ගෙනාවෙත් ලොකු කිරියා ගුරුන්නාන්සේ. හපුවිද පාරම්පරික ලක්ෂා කර්මාන්තයේ නිරත වික්‍රමරත්න මහත්තයා තවත් එක්කෙනෙක් එක්ක ඇවිත් අවුරුදු දෙකක් ලාක්ෂා පුහුණු කළා. ඒක සංවිධානය කළේ කුඩා කර්මාන්තයෙන්. ඉගෙන ගන්නවට දවසකට රුපියල් 2.50 පඩියකුත් දුන්නා. මේක පටන් ගත්තේ 1974 වගේ. මම සම්බන්ධ වුණේ 76 දී. මම ලාක්ෂා කර්මාන්තය පටන් ගත්තේ 83 විතර. සේසත් හදන්න ගත්තේ 88 වගේ. අපි 1997 ජාතික ශිල්ප සභාවෙන් සමිතියක් පිහිටුවා ගත්තා. මම ලේකම් විදිහට 2019 වෙනකල් හිටියා." (කුරුළුවංශ, 2011 මාර්තු 11).

කෙසේවෙතත් දැනට වසර 50ක පමණ සිට සේසත් මිට සෑදීම ද උණවේරුව ගමේ ම සිදුකරයි (ස්වර්ණමාලි, 2019: 341). එහෙත් උණවේරුව ගමෙහි බොහොමයක් ශිල්පීන් සිදුකරන්නේ සේසතෙහි වෘත්තාකාර කොටස සෑදීම පමණි. පාරම්පරික සේසත් ශිල්පී පවුල් 45ක් පමණ ඊට ඇතුළත් වේ. පාරම්පරික සේසත් ශිල්ප පවුල් 5ක් පමණ සේසතේ වෘත්තාකාර කොටස මෙන් ම මිට ද නිර්මාණය කරනු ලබයි (ස්වර්ණමාලි, 2019: 342). වර්ෂ 1994 පමණ වන විට සේසත් සෑදීමට උණවේරුවේ ශිල්පීන් තල්කොළ සොයා ගෙන තිබෙන්නේ මාකලම්පිටිය නම් ගමෙනි. එය උණවේරුවට හැතැප්ම දෙකක් පමණ දුරින් පිහිටා ඇත. එකල සේසත් නිර්මාණ ශිල්පීන්ට තල් ගොබයක් රු. 25ක පමණ මුදලට විකුණා තිබේ (තිලකසිරි, 1994: 212). සේසත් නිර්මාණකරණයට අවශ්‍ය මිනිරන් උණවේරුවේ සේසත් ශිල්පීන් විසින් ලබා ගෙන තිබෙන්නේ තලාගොඩ ප්‍රදේශයෙනි. උණවේරුවේ සිට හැතැප්ම 20ක් පමණ දුරින් එම ගම පිහිටා තිබේ. එකල මිනිරන් කිලෝ එකක් රු. 10ක්, 15ක් පමණ මිලකට විකුණා ඇත (තිලකසිරි, 1994: 212). වර්තමානයේ දී තලාගොඩ මිනිරන් ඉල්ලම් පවතින ප්‍රදේශ මොරගහකන්ද ජලාශයට යටව ගොසිනි.

## 1.3 පර්යේෂණ අරමුණ

ස්වාභාවික අමුද්‍රව්‍යය භාවිත කර සරල තාක්ෂණික ක්‍රමවේද උපයෝගී කරගනිමින් නිර්මාණය කරන හස්ත කලාශිල්පයන්හි අවසන් නිමැවුම ගුණාත්මක බවින් හා අලංකරණයෙන් ද විශිෂ්ට වූවකි. සේසත් යනු එවැනි විශිෂ්ට සාම්ප්‍රදායික නිමැවුමකි. වර්තමානය වන විට මෙම කාර්මාන්තය සිදුකිරීම දිවයිනේ එකම ප්‍රදේශයකට පමණක් සීමා වී ඇත. එබැවින් සාම්ප්‍රදායික සේසත් කර්මාන්තයේ වර්තමාන ස්වරූපය සහ අනාගත පැවැත්ම කෙරෙහි එල්ල වී ඇති අභියෝගයන් පිළිබඳව අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ අරමුණයි.

## 2. පර්යේෂණ ක්‍රමවේදය

සේසත් කර්මාන්තයෙහි නියුතු ශිල්පීන් සමග සම්මුඛ සාකච්ඡා පවත්වමින් සහ ක්ෂේත්‍ර නිරීක්ෂණයන් මගින් තොරතුරු ලබා ගැනීම සිදුකළේය. සම්මුඛ සාකච්ඡා පැවැත්වීමට දීර්ඝ කාලයක් සේසත් කර්මාන්තයේ නිරත වී මෙන් ප්‍රදේශයේ ප්‍රසිද්ධියක් උසුලා සිටින හා පළාත් හස්ත කර්මාන්ත සම්මාන උළලෙන් ඇගයීමට බඳුන් වූ ශිල්පීන් යොදා ගන්නා ලදි. ඒ අනුව මෙහි දී අප විසින් ශිල්පීන් 20 දෙනෙකු සමඟ සම්මුඛ සාකච්ඡා පවත්වන

ලදි. තවද සේසත් කාර්මාන්තයේ සාම්ප්‍රදායික ස්වරූපය හඳුනා ගැනීමට සේසත් කර්මාන්තය පිළිබඳව තොරතුරු සඳහන් පූර්ව පර්යේෂණ වාර්තා ද්විතීක මූලාශ්‍ර වශයෙන් මීට පදනම් කර ගත්තේය.

## 3. ප්‍රතිඵල හා සාකච්ඡාව

### 3.1 සේසත් නිර්මාණකරණය

සේසත කොටස් දෙකකින් සමන්විත වේ. අත්ත සහ මිට යනුවෙනි. අත්ත යනු සේසතෙහි වෘත්තාකාර කොටසයි. සේසත් සෑදීම යනුවෙන් අදහස් කරන්නේ මිට රහිතව අත්ත යනුවෙන් හඳුන්වන එම වෘත්තාකාර කොටස නිර්මාණය කිරීමයි. කෙසේ නමුත් වර්තමානයේ දී උණවේරුව ගමෙහි සේසතේ අත්ත මෙන් ම මිට ද නිර්මාණය කරනු හඳුනාගත හැකිය.

සාම්ප්‍රදායිකව පවත්වාගෙන එනු ලබන හස්ත කලාශිල්පයන් සියල්ලම නිර්මාණකරණයේ දී ස්වාභාවික අමුද්‍රව්‍ය භාවිත කිරීම, සරල තාක්ෂණය හා සරල උපකරණ භාවිතය පොදු තත්ත්වයකි. වර්තමානයේ ඇති වන විවිධ නවීකරණමය ප්‍රවණතා හා තාක්ෂණික දියුණුව හේතු කරගෙන මෙම හස්ත කලා ශිල්පයන්හි සාම්ප්‍රදායික ලක්ෂණ වියැකී යමින් පවතී. අතීතයේ දී ප්‍රධාන මුලද්‍රව්‍ය ලෙස ස්වාභාවික අමුද්‍රව්‍ය භාවිතා කළ ද වර්තමානයේ දී වර්ණක සඳහා කෘතීම වර්ණක යොදා ගැනීම සහ සරල උපකරණ වෙනුවට නවීන යන්ත්‍රෝපකරණ භාවිත කිරීම ද හඳුනාගත හැකිය. සාම්ප්‍රදායික මෝස්තර හා අලංකරණ යම්තාක් දුරට නව මුහුණුවරකින් ඉදිරිපත් කරයි. සේසත කර්මාන්තයෙහි ද මෙම පොදු නවීකරණමය ලක්ෂණ යම්තාක් දුරට හඳුනාගත හැකි වුව ද සාම්ප්‍රදායික නිර්මාණ තාක්ෂණය හා උපකරණ වර්තමානයේ ද භාවිත වේ. අද වන විට උණවේරුවේ සේසත් කර්මාන්තයේ නිරතව සිටින බහුතරයක් කාන්තාවෝ වෙති (කුරුළුවංශ, 2011 මාර්තු 11).

#### 3.1.1 භාවිත අමුද්‍රව්‍යය හා උපකරණ

සේසත් කර්මාන්තයේ ප්‍රධාන අමුද්‍රව්‍යය වන්නේ තල ශාකයයි. තලගොබය කපා ගත් පසු එය අවශ්‍ය ආකාරයට සකස් කර ගැනීමේ කාර්යය පටිපාටියක් තිබේ. අලංකරණ කටයුතු මෙන්ම තවත් විවිධ කාර්යන් සඳහා සෙසු අමුද්‍රව්‍ය කිහිපයක් ද භාවිත කෙරේ.

තලගොබය සහ තලකොළ : තල ශාකයකින් කපා ගන්නා නොඉහිරුණු තල ගොබය සේසත නිර්මාණයේ දී අවශ්‍ය වන ප්‍රධාන අමුද්‍රව්‍යයයි. මෙය කපා ගත් පසු සේසත නිර්මාණය සඳහා අවශ්‍ය පරිදි සකස් කර ගැනීමට තැම්බීම, වියළීම, සායම් දැමීම සිදුකරයි. පළමුව තල ගොබය තල පිත්තෙන් වෙන් කර ගෙන එකින් එක තල කුරු සහ තලකොළය වෙන් කර තලකොළ පන්දු ලෙස සකස් කර ගෙන තැම්බීම සිදුකරයි. තැම්බීමේ දී කොළය ශක්තිමත් වීමට සහ සුදු පැහැය ලබා ගැනීමට එම මුට්ටියට පැපොල් කොළ, අන්නාසි ගොබ, කැප්පෙටියා කොළ, මඤ්ඤොක්කා කොළ එකතු කරයි. හොඳින් තැම්බුණු පසු පන්දු දිගහැර කොළ සුදු පැහැය වන තුරු තද අව්වේ වේළා ගෙන නැවත පන්දු ලෙස සකස් කර ගනියි. එසේ නැවත පන්දු ලෙස සකස් කර ගන්නේ සායම් දැමීම සඳහා ය. සුදු පැහැය මදි වේ නම් පින්නේ දැමීම ද සිදුකරයි. හොඳින් ජලය උණු වූ මුට්ටියකට සායම් දමා මෙම තම්බාගත් තලකොළවලට සායම් යොදන අතර ඉන්පසු මඳ පවනේ වේලා ගනී. ඉන් පසු අවශ්‍ය පරිදි කොළ ඉරා ගැනීම සිදුකළ යුතුය.

තල තට්ටුව හෙවත් තල අත්ත : ඉහිරුණු තල ගොබයක් රැගෙන කුරු ඉවත් කර අව්වේ වේළා මෙම තල අත්ත නිර්මාණය කර ගනී. තමන්ට අවශ්‍ය පරිදි මසන සේසතේ ප්‍රමාණයට ගැළපෙන අයුරින් මෙම තට්ටුව සකස් කර ගත යුතුය. සේසත මැසීම සිදුකරන්නේ එය මතයි.

මිනිරන් ෑ ලොකු මිනිරන් කැබලි පිහිය හෝ නියපොත්ත ආධාරයෙන් පතුරු ලෙස වෙන් කර ගනියි.

තල කුරු ෑ තල පිත්තෙන් තල ගොබය වෙන් කර ගැනීමේ දී ඉවත් කරගත් තල කුරු අව්වේ වේළා ගැනීමෙන් පසු විවිධ සායම් යොදා වේළා ගත් තල කොළ ඉරා කුරුවල ඔතනු ලබයි.

කොකෝ පට්ට ෑ කොකෝ ගොබයේ ඇතුළ් පට්ටේ සේසත් නිර්මාණයේ දී මල්පෙති, පටි මැසීම සඳහා නූල් වශයෙන් භාවිතා කරයි. අතීතයේ දී නුග මුල්, වල්බෙලි හා කලවැල් ආදියෙන් ද පට්ටාං ලබා ගෙන ඇත (ගුණසේකර සහ ගුණවර්ධන, 1984ෑ 174).

වර්ණක ෑ තල කොළ විවිධ සායම් දමා වර්ණ ගන්වමින් සකස් කර ගන්නා මල්පෙති මෙන්ම ඔතන ලද තල කුරු සේසතේ අලංකාර මෝස්තර යෙදීමට යොදාගනී. සේසතක ප්‍රධාන වර්ණ ත්‍රිත්වයකි. එනම් රතු, කහ සහ සුදු ය. අතීතයේ දී මෙම වර්ණ සාදා ගෙන ඇත්තේ ස්වාභාවික අමුද්‍රව්‍යයවලිනි.

- පතිගි නමින් හඳුන්වන ලීයේ අරටවු වතුරේ තම්බා ගැනීමෙන් රතු සාදා ගනී.
- අමුකහ භාවිතා කරමින් කහ පාට සාදා ගනී.
- තල කොළයේ ස්වාභාවික පාට සුදු පාට බැවින් එය එලෙසම සුදු පැහැයට යොදා ගනී.

වර්තමානයේ ස්වාභාවික වර්ණ වෙනුවට කෘතීම වර්ණ වූ කුකුළ් සායම් භාවිත කිරීම නිසා විවිධ වර්ණයේ සේසත් දක්නට ලැබේ.

සේසත් නිර්මාණය සඳහා භාවිත කරනු ලබන්නේ සරල උපකරණ කිහිපයකි. ඉදිකට්ට, කතුර, දැති කතුර, කවය, කොළ ඉරන පිහිය බහුලව ම භාවිත උපකරණ ය. මෙහි විශේෂ උපකරණය වන්නේ පත්තස්සයි. පැතලි තල කුරේ පිට පොත්ත රැහීමෙන් පසු දෙකට නවා ගැනීමෙන් මෙය සාදා ගනී. මෙමගින් සිදුකරන්නේ තලකොළය ඉරා ගැනීම හා මැද ගැනීමයි. සේසත නිර්මාණය කර ගැනීමේ දී පළමුව අලංකරණ කටයුතු සඳහා යොදාගනු ලබන පටි හා මල් පෙති සකස් කර ගත යුතුය. රතු, සුදු, හා කහ ආදී තනි වර්ණ යෙදු තනි පටි, ඩබල් තනි පටි, දත් පටි, කුරු පටි ලෙස පටි විවිධාකාරයෙන් සකස් කර ගනියි. මල් පෙති සකස් කර ගැනීමේ දී ශිල්පියාගේ රුචිකත්වය පරිදි විවිධාකාරයෙන් සකස් කර ගත හැකිය.

### 3.1.2 සේසත් සකසා ගන්නා ආකාරය

තල කුරු රැහැ ගනිමින් සේසතේ ප්‍රමාණයට අනුව චතුරස්‍රව සකස් කර ගත් තල අත්ත රැගෙන එහි මැද මිනිරන් කැබැල්ලක් තබා ඒ මත කුඩාවට රවුම් හැඩයෙන් කපාගත් තල කොළය තබා මසා ගනු ලබයි (බොහෝ විට සුදු පැහැති රවුම් තල කොළයක් භාවිත කරන නමුත් ශිල්පියාගේ කැමැත්ත පරිදි වෙනත් වර්ණයක් ද යොදා ගත හැකිය). මෙම රවුම් හැඩැති තල කොළය 'බොත්තම' ලෙස ශිල්පීහු හඳුන්වති. මෙම චතුරස්‍රාකාර තල කොළයේ සේසත නිර්මාණය කිරීමට මතුපිට සුදුසු ලෙස සකස් කර ගත් මිනිරන් අතුරනු ලබයි. එහි දී සම්පූර්ණයෙන් ම මිනිරන් අතුරා ඉන්පසු මාලයෙන් මාලයට මසා ගැනීම සිදුකළ හැකි අතර මාලයෙන් මාලයට වෙනම මිනිරන් අතුරා ගනිමින් සේසත නිර්මාණය කර ගැනීමට ද හැකිය. ඉන්පසු එම බොත්තමේ මධ්‍ය ලක්ෂයේ සිට තබා ගන්නා කවය ආධාරයෙන් වටේට රවුමක් සළකුණු කර ගනියි. මේ ආකාරයට මාලයෙන් මාලයට මසා ගැනීමේ දී කවය ආධාරයෙන් අවශ්‍ය රවුම නිර්මාණය කර ගත හැකිය.

ඉන්පසු එම රවුම මත දත් පටිය තබා මසා ගනු ලබයි. එම දත් පටිය මත ඔතා ගත් කුරු පටිය තබා මසා ගැනීමෙන් පසු මල්පෙති හා විවිධ මෝස්තර යොදා අලංකාර කර ගැනීම සිදුකළ යුතුය. මෙය එක් මාලයකි. මෙලෙස මාලයෙන් මාලයට අවශ්‍ය පරිදි තල අත්ත

මත මිනිරන් අතුරා ගනිමින් එකින් එක මාලය මැසීම සිදුකළ හැකිය. මෙහි දී සේසතේ කලාත්මක බව සුරැකෙන පරිදි උචිත අලංකාර මෝස්තර යොදා ගැනීම කෙරෙහි ශිල්පියා සැළකිලිමත් විය යුතුය. ශිල්පියාගේ දක්ෂතාව මත එහි දී විවිධ හැඩැති මල් පෙති හා විවිධ අයුරින් ඔතා ගත් විවිධ පටි යොදා ගැනීම සිදුවේ. සේසත නිර්මාණයේ දී එහි යොදා ගන්නා මාල ගණන විවිධ ය. බොහෝ විට මාල 3, 5, 6, 7, 9 ආදී වශයෙන් සේසත නිර්මාණය කරයි. මෙම මාල නිර්මාණය කිරීමේ දී සේසතේ ගැනුම්කරුවා අනුව මාල ගණන වෙනස් වේ. මෙම සම්ප්‍රදාය අතීතයේ දී භාවිත වූවකි. බුදුන් වහන්සේ සඳහා මාල 07ත්, දෙවියන්ට මාල 06ත් සහිත සේසත් පූජා කරන ලද අතර රජුට මාල 05ත්, ප්‍රභූන්ට මාල 04 හා සාමාන්‍ය ජනතාවට මාල 03 සහිත සේසත් නිර්මාණය කර ඇත. මාල තුනක් ඇති සේසතක සාමාන්‍ය විශ්කම්භය අඟල් 28කි. පළමු මාලය අඟල් 6ක් ද, දෙවන මාලය අඟල් 3ක් ද, තුන්වනමාලය අඟල් 2ක් ද වශයෙන් නිර්මාණය කරන අතර එක් එක් මාලයට පිටතින් ඇති බෝඩරය අඟලක් පමණ වේ (ගුණසේකර සහ ගුණවර්ධන, 1984: 174).

එක් සේසතක් නිර්මාණයට පියන් දෙකක් ඇති අතර සේසත් ජෝඩුවකට පියන් 4ක් අවශ්‍ය වේ. සේසත් පියන් දෙක දෙපසට මුහුණ ලා වන ලෙස පුවක් පටි යොදා සම්බන්ධ කර එක් සේසතක් සාදා ගනී. ඉන් පසු එම සේසත් පලු දෙක සම්බන්ධ කිරීමට වටේට කැප්පෙටියා වැල් භාවිත කරමින් ගැට වැල සකස් කර ගනියි. පසුව බැවුම් කොළය යොදා සම්පූර්ණ සේසතක් නිර්මාණය කර ගනු ලැබේ.

සේසත නිර්මාණය කිරීමේ දී එය ඉතා සංයමයෙන් යුක්තව රටාවකට අනුව සිදුකළ යුතුය. අලංකරණ මෝස්තර යෙදීමේ දී එය සේසතේ කලාත්මක බව ආරක්ෂා වන පරිදි නිවැරදි ආකාරයෙන් භාවිත කළ යුතුය. මෙහි ශිල්පීය ක්‍රමය විමසීමේ දී කොටස් දෙකක් පවතී. එහිදි සම්පූර්ණ සේසත් නිර්මාණය කුමක්ද යන්න හඳුනා ගත යුතුය. ඒ අනුව සම්පූර්ණ සේසත් නිර්මාණයක් ලෙස හඳුන්වන්නේ සේසත් ජෝඩුවකි. සේසත් ජෝඩුව යනු සේසත් පලු 04 ක්, සේසත් මිටි 02 ක් හා මුරායුධ මිටි 02 එකතු වූ විට ය.

මෙහි දී සේසත තල ශාකය ආශ්‍රිතව නිර්මාණය කර ගන්නා අතර මිට සඳහා බහුලව හපු ශාකය භාවිත කරයි. මිට අලංකරණය කරන්නේ ලාක්ෂාවලිනි. ඒ අනුව සේසත් කර්මාන්තය හා සබැඳි තවත් සාම්ප්‍රදායික කර්මාන්තයක් ලෙස ලාක්ෂා කර්මාන්තය පෙන්වාදිය හැකිය.

### 3.1.3 මෝස්තර හා අලංකරණ

සේසත අලංකාර කිරීම ශිල්පියාගේ දක්ෂතාව සහ කලා කුසලතාව මත පදනම් වේ. දක්ෂ ශිල්පියෙකු අවම මෝස්තර අලංකරණයෙන් ඉතා කලාත්මක නිර්මාණයක් බිහි කරයි. ඒ අනුව කලාව සීමිත අයුරින් යොදා ගැනීම මෙහි විශේෂ කරුණක් ලෙස හඳුනාගත හැකිය. මෙහි දී බහුලව යොදා ගන්නා මෝස්තර කිහිපයක් වන අතර ඒවා පටි සහ මල්පෙති ලෙස කොටස් දෙකකි.

පටි : සිහින්ව ඉරා ගන්නා තලකොළය තල කූරේ ඔතා ගැනීමෙන් මෙම පටි සකසා ගනී. මෙලෙස සකසා ගන්නා පටි ප්‍රධාන වශයෙන් යොදාගන්නේ සේසතේ අලංකරණය සඳහා ය. ඒ අනුව මෙම පටි මඟින් විවිධ මෝස්තර දක්ෂ ශිල්පියෙකුට නිර්මාණය කළ හැකිය. ඒ අතර බහුලව යොදා ගන්නා මෝස්තර කිහිපයක් වේ.

- ලියවැල
- ත්‍රිකෝණය
- බීක්කුව
- ඩබල් බීක්කුව
- පලා පෙති
- දම්වැල

- බිඳන ලද බීක්කුව
- කතිරය

මල්පෙති : විවිධ වර්ණ යෙදූ මල්පෙති සේසතේ කලාත්මක බවට උචිත පරිදි කපා ගත හැකිය. මෙලෙස කපා ගන්නා මල් පෙති සේසතේ අලංකාරය වැඩි කිරීමට හේතුවේ.

### 3.2 සේසත් කර්මාන්තය හා සම්බන්ධ විශ්වාස

ලංකාවේ ක්‍රියාත්මක වන බොහෝ ශිල්ප කර්මාන්තයන් හා බැඳුණු ඊට ම ආවේණික වූ විවිධ ඇදහිලි හා විස්වාස පවතී. එම ලක්ෂණය සේසත් කර්මාන්තයට ද පොදු වූවකි. සේසත් ශිල්පීහු සරස්වතී දෙවියන්ව ස්වකීය කර්මාන්තට සම්බන්ධ දෙවියන් ලෙස සළකනු ලබති. එබැවින් ඔවුහු නිරන්තරයෙන් සරස්වතී දෙවියන්ට පුද පූජා සිදුකරති. තවද මෙම කර්මාන්තයෙහි නියැලීමට ඒ පිළිබඳව හොඳින් ඉගෙන ගත යුතුය. නොදන්නා අය කර්මාන්තයේ නියැලීමේ දී වස්දොස් පවතින බවට ශිල්පීහු සළකති. එම නිසා එය නිවැරදිව ඉගෙන ගෙන කිරීම වඩාත් යෝග්‍ය වේ. එසේ කිරීම මෙම ශිල්ප කර්මාන්තයේ ඉදිරි පැවැත්මටත් පිටිවහලකි. සේසතක වැඩ ආරම්භ කිරීම සම්බන්ධයෙන් ද විස්වාස පවතී. සතියේ බදාදා සහ සෙනසුරාදා වැනි දවස්වල දී සේසතේ වැඩ ආරම්භ කළ විට එය නිසියාකාරව සිදුකළ නොහැකි බවට මෙම ශිල්පීහු විස්වාස කරති. ඒ අනුව අලුත් සේසතක් මැසීම ආරම්භ කරන්නේ එම දිනයන් අතහැර සතියේ අනෙක් දිනවල දී ය.

මෙම සේසත් අලෙවි කිරීමේ දී අනිවාර්යෙන් ම සේසත් ජෝඩුවම අලෙවි කළ යුතුය. එහි දී එක් සේසතක් පමණක් අලෙවි කිරීම සිදුනොකරන අතර එකක් විකිණීම එක අතක් පමණක් බරින් නිදහස් වීමක් ලෙස සළකයි. ඒ අනුව ජෝඩුවම විකිණීමෙන් දෙඅතේම බරින් නිදහස් වීමක් ලෙස සළකයි. විශාල ලෙස නිර්මාණය කරන සේසත් විහාර ආරාමවල, ආයතනවල තැබීමට යොදා ගන්නා අතර නිවාසවල ඇස්වහ කටවහ දුරු වීමට කුඩා සේසතක් තැබීම යෝග්‍ය යැයි සැලකේ (පෞද්ගලික දත ගැනීමකි, සේසත් ශිල්පී කේ. ජී. සිරිපාල මහතා සමඟ සිදුකළ සාකච්ඡාව, 2022-03-10).

### 3.3 සේසත් නිර්මාණකරුවන් මුහුණ දී ඇති ගැටලු

සේසත් නිර්මාණකරුවන් මුහුණ දී ඇති ප්‍රධාන ගැටලුව සම්බන්ධයෙන් සවන්දිරක්කාර ගෙදර අනුර සේසත් නිර්මාණ ශිල්පියා මෙලෙස විස්තර කරයි.

> "අද අපට තිබෙන ලොකුම ප්‍රශ්නය සේසත් නිර්මාණයට අවශ්‍යය තලාතු මිනිරන් සොයා ගැනීමට නොහැකි වීමයි. මොරගහකන්ද හැදෙන්න කලින් අපිට ඕන තරම් මිනිරන් ලැබුණා. කිලෝව රුපියල් 50.00ට 60.00ට ගත්තේ. මිනිරන් තිබුණ තැන් ඔක්කොම වතුරට යට වුණා. අපි කිව්වා ජලාශයට වතුර පුරවන්න කලින් මේවා ගොඩගමු කියලා. කවුරුවත් ඒකට ඇහුම්කන් දුන්නේ නැහැ. දැන් ඉල්ලුමට අවශ්‍යය මිනිරන් නැති නිසා කළුකඩ මුදලට තමයි ඒවා ගන්න වෙලා තියෙන්නේ. කිලෝව රුපියල් තුන් හාරසීයක් වෙනවා. ආණ්ඩුවේ රක්ෂිත වල මිනිරන් තියෙනවා. ඒවා ගන්න විදිහක් නැහැ. කොවිඩ් වසංගතයත් එක්ක තත්ත්වය තවත් දරුණු වුණා." (කුරුළුවංශ, 2011 මාර්තු 11).

### 4. නිගමන හා නිර්දේශ

සාම්ප්‍රදායික සේසත් කර්මාන්තය නූතනය වන විට ගැටලු රැසකට මුහුණ පා තිබේ. එයින් ප්‍රධානතම ගැටලුව වන්නේ අමුද්‍රව්‍යය සපයා ගැනීමයි. නිර්මාණකරණයට අවශ්‍ය තලාතු මිනිරන් සපයා ගැනීමට නොහැකි වීම බරපතල ගැටලුවකි. පෙර දී ඇලහැර තලාගොඩ ප්‍රදේශයෙන් තලාතු මිනිරන් සපයා ගෙන තිබෙන අතර එම මිනිරන්

පතල මොරගහකන්ද ජලාශයට යටවීම නිසා අද වන විට මිනිරන් සපායා ගැනීමට නොහැකි වී තිබේ (විජයවර්ධන, 2021 ජනවාරි 6).

සාමාන්‍ය සේසත් ජෝඩුවක් රුපියල් 7000.00ක් පමණ වේ. මිටත් එක්ක එය රුපියල් 10000.00කි (2021 වර්ෂයේ දී අළෙවි වූ මිළ ගණන්ය). සාමාන්‍යයෙන් සේසතක් නිර්මාණය කිරීමට දින 10ක් පමණ ගතවේ (කුරුළුවංශ, 2011 මාර්තු 11). ලංකාවේ සේසත් හදන එකම ගම උණවේරුව වුවත්, වර්තමානයේ දී අලව්වෙන් ද සේසත් සැපයෙයි. මේ නිසා උණවේරුවේ සේසත් අලෙවිකර ගැනීම ප්‍රශ්නයක් වී තිබේ. රජයට අයත් ලක්සල, ශිල්පීන් ගෙන් සේසත් ලබාගෙන ඒවා විකුණා අදාළ මුදල් නැවත ශිල්පීන්ට ලැබෙන්න වසර ගණනාවක් ගත වේ (විජයවර්ධන, 2021 ජනවාරි 6). මේ නිසා පෞද්ගලික වෙළෙඳුන්ට අඩු මුදලකට සේසත් මෙම ශිල්පීන් විකුණන අතර එම පෞද්ගලික අංශයේ වෙළෙඳුන් ඉතා විශාල මුදලකට විදෙස් ගැණුම්කරුවන්ට සේසත් අළෙවි කොට අතරමැදියන් ලෙස විශාල ලාභයක් ලබයි. මේ ආකාරයට තමන්ව ගසාකන බවට සේසත් නිර්මණ ශිල්පීහු චෝදනා කරති. සත්‍ය ලෙසම සිදුවිය යුත්තේ රාජ්‍ය හෝ පෞද්ගලික අංශයේ ලාභ පරමාර්ථවලට මෙම ශිල්ප කර්මාන්ත හසු නොවීමයි. එහෙත් වර්තමානයේ දී ක්‍රියාත්මක සමාජ යාන්ත්‍රණයට අනුගතව කටයුතු කරනවා හැර වෙනත් විකල්පයක් මෙම ශිල්පීන්ට නොමැත. එසේ අනුගත වීම යම් තරමකට හෝ මෙම ශිල්පයෙහි පැවැත්මට සුබදායී වේ. වියැකෙමින් යන මෙම සාම්ප්‍රදායික කර්මාන්තයෙහි ඉදිරි පැවැත්මට ක්‍රමවත් වැඩපිළිවෙලක් යටතේ ක්‍රියාත්මක රාජ්‍ය මැදිහත් වීමක් අත්‍යාවශ්‍ය වේ. තවද පුරාවිද්‍යාව, ලලිත කලාව විශේෂ උපාධිය හදාරන විද්‍යාර්ථීයින්ට මෙවැනි සාම්ප්‍රදායික ශිල්ප කර්මාන්තයන් පිළිබඳව පුළුල් වශයෙන් අධ්‍යයනය කිරීමට අවස්ථාව සලසා දීම මගින් සාම්ප්‍රදායික ශිල්පයන්ගේ අනාගත පැවැත්ම යම් පමණකට හෝ සුරක්ෂිත කළ හැකිය.

## 5. ආශ්‍රිත ග්‍රන්ථ


අභයවර්ධන, එච්. ඒ. පී. (1978). කඩයිම් පොත් විමර්ශනය. සංස්කෘතික කටයුතු අමාත්‍යංශය. කොළඹ.

කුරුළුවංශ, අසේල. (2021 මාර්තු 11). "රජ ගෙදරටත් සෙත සලසන උණවේරුවෙ සේසත් කතාව". දිනමිණ. ලේක්හවුස්. කොළඹ. http://www.dinamina.lk/2021/03/11/**විශේෂාංග**/117637/**රජ-ගෙදරටත්-සෙත-සලසන-උණවේරුවේ-සේසතේ-කතාව**, 2022-10-13 දින පරිශීලනය කරන ලදි.

ගුණසේකර, සුදත් සහ ගුණවර්ධන, එච්. ඇම්. (1984). "මාතලේ දිසාවේ පාරම්පරික කලා ශිල්ප", ඓතිහාසික මාතලේ, සංස්. සිරිල් ගමගේ, එස්. එස්. විජේසූරිය සහ තවත් අය. මාතලේ දිසා සංස්කෘතික මණ්ඩලය. මාතලේ.

තිලකසිරි, ජයදේව. (1994). ශ්‍රී ලංකාවේ පාරම්පරික ශිල්ප ගම් හා පාරම්පරික ශිල්පීන්ගෙන් පැවත එන පවුල් පිළිබඳ සමීක්ෂණයක්. එස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.

දිසානායක, ජේ. බී. (වර්ෂය සඳහන් නොවේ). "අටළොස් කුලෙකැ දෙවියන්", සිංහල සංස්කෘතිය හා කලා ශිල්ප, ඇම්. බී ආරියපාල උපහාර අංකය, සංස්. ජී. හේමපාල විජයවර්ධන සහ තවත් අය. සිංහල අධ්‍යයන අංශය, කොළඹ විශ්වවිද්‍යාලය. කොළඹ.

ධර්මබන්දු, ටී. ඇස්. (1962). සිංහල මහා අකාරාදිය. ඇම්. ඩී. ගුණසේන සහ සමාගම. කොළඹ.

ලෝරි, ඒ. සී. (2014). ලෝරි ගැසටියර්. සංස්. එච්. එම්. ඩී. ආර්. හේරත්, මධ්‍යම පළාත් සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව. මහනුවර.

සිංහල බෝධිවංශය. (1970), සංස්. ගුණපාල සේනාධීර. අභය ප්‍රකාශකයෝ. ගල්කිස්ස.

රුදිගු, ඊ. (1960). "අභාවයට යන ලංකාවේ අත්කම්", ලංකා කලා මණ්ඩලය කලා සඟරාව 1 වෙනි කලාපය. සංස්කෘතික කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව, කොළඹ.

විජයවර්ධන, කුසුම්සිරි. (2021 ජනවාරි 6). "හංස ගීතය ගයන උණවේරුවේ සේසත්". අන්තර්ජාලය හරහා ප්‍රකාශිත ලිපියකි, https://roar.media/sinhala/main/travel/sesath, 2022-10-13 දින පරිශීලනය කරන ලදි.

සෙනෙවිරත්න, එස්. (1996). "උත්තර මලය රටේ ප්‍රාථමික යකඩ යුගයේ ඛණිජ සම්පත් පරිහරණයේ ඓතිහාසික පුරාවිද්‍යාව". ඓතිහාසික මහනුවර. ශ්‍රී සුමංගල විද්‍යාලීය බෞද්ධ සංගමය. මහනුවර.

ස්වර්ණමාලි, තක්ෂිලා, (2019). ලාක්ෂා, ලාක්ෂා කලාව සහ පාරම්පරික ලාක්ෂා ශිල්පීය ජනතාව, ඇගැල්මා ප්‍රකාශන. ප්‍රකාශිත ස්ථානයක් සඳහන් නොවේ.

Lawrie, A. C. (1898). A Gazetter of the Central Province of Ceylon Vol. II. George J. A.Skeen. Government Printers. Colombo.

Tilakasiri, Jayadeva. (1994). Handicrafts of Sri Lanka. Aitken Spence Printing (Pvt) Ltd. Colombo.